# අපූරු මිතුදම



සඳසරා මෙත්මන්ති මහකුඹුර

# අපූරු මිතුදම

**සඳසරා මෙත්මන්ති මහකුඹුර**

කතෘ

**කතෘගේ වෙනත් කෘති**

*සාමාලි සහ පුංචි සුරංගනාවි*

**මහමායා බාලිකා විදුහල - මහනුවර**

**6 ශ්‍රේණිය B**

**2025/02/08**

**ISBN : 978-624-208-774-0**

# පිදුම

*මහාමායා විදු පියසට මුලින්ම පැමිණි මොහොතේ සිට පුරා  වසර පහක් සිප් සතර ලබාදෙමින්ද, හොඳ නරක පෙන්වා දෙමින්ද අප යහමඟට යොමු කළ 1 හා 2 ශ්‍රේණි භාරව කටයුතු කළ දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්, 3 හා 4 ශ්‍රේණිවලදී අප දිරිමත් කල නෙරංජලා ගුරු මෑනියන්ටත්, 5 ශ්‍රේණි භාරව සිටි තිලකා ගුණතිලක ගුරු මෑණියන්ටත් ප්‍රාථමික අංශයේ සියලුම ගුරු මෑණිවරුන් සහ පියවරුන්ටත් මෙම කෘතිය ආදරයෙන් පිළිගන්වමි.*

**සඳසරා මෙත්මන්ති**

**2024 – 6 ශ්‍රේණිය B**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ  ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන්  සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට  නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකෝමත් එක රටක හිටියා මොරියා ජේම්ස් කියලා පුංචි ගැහැනු ළමයෙක්. එයාට හිටියා පුංචි දඟකාර කටකාර මල්ලී කෙනෙක්. එයාගේ නම ඩැරල් ජේම්ස්. මොරියාගේ අම්මයි තාත්තායි මිසිස්. ජේම්ස් සහ මිස්ට ජේම්ස්. දැන් පාසල් නිවාඩුව අවසන් වී ඇති නිසා මොරියා පාසල් යෑමට සූදානම් වුණාය.

මොරියා තම බෑගයට ඇඳුම් පැළඳුම්, පොත් ආදී පාසල් උපකරණ සහ ඇයගේ මව වන මිසිස් ජේම්ස් ලබාදුන් චොක්ලට් කේක්, බිස්කට් ආදී රසකැවිලි ද දමා ගත්තාය. මොරියාගේ වාසනාවට ඇයගේ මල්ලී ඩැරල් යන්නේ වෙනත් පාසලකටයි. මොරියාගේ පාසල ශාන්ත කැතරින් පාසලයි. මොරියා හට පාසලට යන තෙක් ඉවසිය නොහැකිය. මේ ඇයගේ තුන්වන ශ්‍රේණියේ අවසන් වාරයයි. ඇයගේ වයස අවුරුදු දොළහයි. මිසිස් ජේම්ස් මහත්මිය ඇයව දුම්රියපොළ වෙත රැගෙන ගියාය. එහිදී මොරියාට තම මිතුරියන් තිදෙනා වන බෙලින්ඩා ඇලීසියා සහ ජෙනීව හමුවූහ.

‘‘හලෝ මොරියා, ඔයා නිවාඩු කාලයේ කෑම ගොඩක් කාලා වගේ. ’’ එසේ කීවේ ජෙනීය.

‘‘ඔව් මටත් එහෙම පේනනවා.’’ ඇලීසියා කීවාය.

අර අලුත් ගැහැනු ළමයි දෙන්නෙක් වගේ.

‘‘ඔව් ඒ අලුත් ගැහැනු ළමයි දෙදෙනෙක්. එක්කෙනෙක් අයලීන්. අනිත් එක්කෙනා පෝලීන්ලූ. අයිලීන් නම්

ටිකක් කරුණාවන්තයි වගේ. හැබැයි පෝලීන් නම් මුරණ්ඩුයි වගේ.'' එසේ පැවසුවේ බෙලින්ඩා.

''අන්න අපේ කෝච්චිය එනවා වගේ. අම්මේ මං යනවා.''

''පරිස්සමින් යන්න. පැටියෝ'' කියමින් මිසිස් ජේම්ස් මෝරිස් දිවයන දෙස බලා සිටියාය. අපි සිවුදෙනාම අම්මාට අත වැනූහ.

ඒත් සමඟ ම දුම්රිය පැමිණියේය. අපි ඉක්මනට දුම්රියට නැග ගත්තෝය. පැය දෙකකින් පසු අපි ශාන්ත කැතරින් පාසල වෙත ළඟා වූහ. ළමයි දුම්රියෙන් බැස ගත්තේ ඉමහත් සතුටිනි. අපි අනිත් ළමයි වෙත ගොස් කතා කළහ.

''හේයි! ගුඩ් මෝර්නින්. ආ! ගුඩ් මෝර්නින් රෙබෙකා. මේ වාරයේ නම් රෙබෙකා හොඳින් ඉන්න පොරොන්දු වුණා නේද? මොරියා ඇසුවාය. ''

''අනිවාර්යෙන්ම මොරියා. මම මේ වාරයේ නරක වැඩ නොකර ඉන්න පොරොන්දු වෙනවා.''

තේ පානය කිරීමේ සීනුව නාද වුණා. ගැහැනු ළමෝ ආපන ශාලාව වෙත පිටත් වූහ. අපි වාඩිවන මේසයේ අලුත් ගැහැනු ළමයි දෙදෙනා වාඩි වී සිටියෝය.

''හායි! ඔය දෙන්නාගේ නම් මොනවාද?'' බෙලින්ඩා ඔවුන්ගේ නම් දැන සිටියත් ඇසීම දෙයක් නොතිබූ හෙයින් ඇසුවාය.



''මගේ නම අයිලීන්. අයිලීන් සිනාමුසු මුහුණින් කීවාය.''

''මගේ නම පෝලීන්. ඇය රළු කටහඬක් ඇති ගැහැනු ළමයෙක් බව අපි හඳුනා ගත්තෙමු.''

තේ මේසයේ බීම, බිස්කට්, කේක් වලින් පිරී තිබුණි. අපි හොඳින් බඩ පුරවා ගත්තෙමු. තේ බීමෙන් පසු අපි නේවාසිකාගාරය වෙත ගියෙමු. එහිදී මේට්‍රන් අප සිටිය යුතු ස්ථාන බෙදා දුන්නාය. මොරියා ළඟ සිටියේ බෙලින්ඩා සහ ජෙනී බැවින් මොරියා ඉතා සතුටට පත් වුණාය.

රාත්‍රී ආහාරයෙන් පසු දැඩි වෙහෙස නිසා අපි ඉක්මනින්ම නින්දට ගියෙමු. සෙනී උදෑසනින් ම අවදි වී ජනේලය ළඟට ගොස්

''අද නම් හරිම ලස්සන දවසක් කියා කෑ ගැසුවාය.'' එම හඬින් අපි බිය වී නැගිට්ටෙමු.

''අයියෝ මොනවාද සෙනී මම චොක්ලට් කේක් කෑල්ලක් කන්න ගියා විතරයි.'' ඒ අපේ පන්තියේ ට්‍රේසිය. ඇය කෑමට ඉතා පෙරේතය.

''ඔයා හීනයක් දැක්කා නේද?'' බෙලින්ඩා සිනාසෙමින් ඇසුවාය.

ට්‍රේසිට තරහා ගියත් ඇයත් අන් අය සමඟ සිනාසුණාය.

''ආ... ආ... දැන් ගොඩක් පරක්කුයි. හැමෝම ඉක්මනට මූණ හෝදාගෙන ඇඳුම් ඇඳගෙන ලෑස්ති වෙන්න.'' ඒ මේට්‍රන්ගේ කටහඬයි.

අපි ලහි ලහියේ ලෑස්ති වුණෙමු. ඉන් පසුව ආහාර ගැනීමේ සීනුව නාද වූ බැවින් අපි ආපන ශාලාව වෙත ගියෙමු. ආහාර ගැනීමෙන් පසු අපි පන්ති කාමරයට ගියෙමු. පන්තිය පුරාම අලුත් තීන්ත සුවඳ පැතිරෙයි. මොරියා දුව ගොස් ජනේලය ඇරියාය. හමා ආ සිසිල් සුළඟින් අපිට නැවුම් ප්‍රබෝධමත් බවක් දැනුණි. මොරියා, බෙලින්ඩා, ජෙනී සහ ඇලීසියා ඉක්මනින් ම ජනේලය අසල තිබූ මේස හතර වෙත පැමිණිහ. අනිත් ළමයි ද තම තමන් සිටින ස්ථාන වෙත ගියහ.

ටික වේලාවකින් අපේ පන්ති භාර ගුරුතුමිය වන මිසිස් ග්‍රේන් මහත්මිය පැමිණියාය.

''සුභ උදෑසනක් වේවා! හැමෝටම'' ඇය සිනාමුසු මුහුණින් පැවසුවාය.

අපි සැවොමත් සුභ උදෑසනක් වේවා! කියා ඇයට සුබ පැතූහ.

''හරි, දැන් අවසාන වාරයට නියමිත වැඩ පටන් ගනිමු. හා, මිස් ග්‍රේන් බෙලින්ඩා හයියෙන් කීවාය. මම හිතනවා මේ වාරයේ මගේ පුංචි කෙල්ලෝ ටික නරක වැඩ කරන්නේ නැතිව ඉඳියි කියලා.''

''අනිවාර්යයෙන් මිස් ග්‍රේන් මොරියා මිමිණුවාය.''


Today is 2nd of January 2025
Good Morning!
Book

''අපි දැන් පන්ති නායිකාව තෝරා ගනිමු. මම ඒකට පෙට්ටියකුයි, කඩදාසි කැබලි ටිකකුත් ගෙනාවා. හොඳට හිතලා ඔයාලා ඡන්දය දෙන්න.''

ඩේසි, කඩදාසි කැබළි බෙදා දුන්නාය. අපි තම තමන්ගේ කඩදාසි කැබැල්ලේ නම ලියා අවසාන් වූ පසු මිසිස් ග්‍රේන් පෙට්ටිය රැගෙන පැමිණියාය. අපි එයට කඩදාසි කැබළි දැමුවෙමු. ඩේසි සහ අයිලීන් විසින් ඡන්දය ගණන් කරන ලදි.

''හරි, දැන් අපි සූදානම් වන්නේ පන්ති නායිකාව කවුරුන්දැයි පැවසීමටය. ඒ අපි සැවොම එක්ක හොඳින් සිටින, හොඳින් පාසල් වැඩ කරන අපේ චූටි ජේනීය.''

ජේනීගේ මුහුණ සතුටින් රතු වූවාය. අපි තිදෙනාගේ හොඳම යෙහෙළියක් බැවින් මොරියා, ඇලීසියා සහ බෙලින්ඩාටද මහත් සතුටින් හිස වැණුවෝය. ඇය පන්තියේ සියලු දෙනාටම ස්තූති කළ අතර තම උපරිමයෙන් පන්තිය බලාගන්නා බවටද මිසිස් ග්‍රේන් හට පොරොන්දු වූවාය.

ඉන් පසුව පන්තියේ ඉගෙනීම් කටයුතු ආරම්භ වූවාය. අපි සැවොම හොඳින් ඉගෙනීම් කටයුතු වල යෙදුණේ ගිය වාරවලට වඩා උනන්දුවෙන් පාඩම් වැඩ සිදු කළේ මෙවර වාර අවසාන විභාගය සමත් නොවුහොත් අපට සිව් වැනි ශ්‍රේණියට යාමට නොහැකි බැවිනි.



විවේක කාලය එළැඹුණි. අපි සිව්දෙනාම පාසල වටා ඇවිද්දෙමු. අපි අපේ පරණ පාසල් ගොඩනැගිල්ලට යාබද වන විට අප හට කිසියම් කෙඳිරිලි හඬක් ඇසුණි. අපි සිව් දෙනා මුහුණට මුහුණ බලා ගත් අතම සිටියෙමු.

කිසිම දෙකයට බිය නැති බෙලින්ඩා ඉදිරියෙන් ම ගමන් කළාය. ඇය අපේ පරණ පුටු මේස ඇති ස්ථානය වෙත ගමන් කළාය. අපිත් ඒ පිටු පසින් ම ගමන් කළෙමු.

පුදුමයකි! එහි සිටියේ තුවාල වී සිටින පුංචි බලු පැටියෙකි. බෙලින්ඩා අන් කිසිම දෙයකට බිය නැති වුවත් බල්ලන්ට නම් ඉතා බියය. එහෙත් මොරියා බල්ලන්ට බිය නැති බැවින් මොරියා බලු පැටවා ළඟට ගියාය.

අහෝ! උගේ එක් පාදයක් තුවාල වී ලේ ගලමින් තිබුණි. අපි උඟට ප්‍රතිකාර කිරීමට නේවාසිකාගාරයට ඇතුල් වීමට ගියා පමණි. සීනුව  නාද වූ  බැවින් අපි හනි හනික පන්තිය වෙත ගියෙමු.

ඒ වන විට අපිට ප්‍රංශ භාෂාව උගන්වන මිසිස් රියා මහත්මිය පන්තියට පැමිණ නොතිබූ බැවින් අපට මහත් සැනසිල්ලක් දැනුණි. අපි පන්තියට පැමිණියත් අපේ සිතේ ඇත්තේ එක්  සිතුවිල්ලකි. අර බලු පැටියාට කුමක්  වී ඇත්දැයි යන්නයි. අවසාන කාලච්ඡේදය  අවසන් වී පාසල නිමවූ පසු අපි

ඉක්මනින් ම පරණ ගොඩනැගිල්ල වෙත ගියෙමු. ඇලීසියා ඉක්මනින් නේවාසිකාගාරය වෙත දිව ගොස් ප්‍රථමාධාර රැගෙන ආවාය.

මොරියා බලු පැටියාගේ තුවාල වලට බෙහෙත් දමා කකුල වෙළුම් පටි වලින් එතුවාය. ඉන්පසු ව තේ පානය කිරීමේ සීනුව නාද වූ බැවින් අපි ඉක්මනින් ම නේවාසිකාගාරය වෙත ගියෙමු.

ඉන්පසු හනි හනික මුහුණ සෝදා ඇඳුම් ඇඳගත් අපි ඉක්මනින් ම ආපන ශාලාව වෙත ගියෙමු.

එහි දී ආ... ''මොකද මේ කෙල්ලො ටික පරක්කු වුණේ'' මේට්‍රන් රළු ලෙස ඇසුවත් ඇය කරුණාවන්ත බව අපි සියල්ලෝම දනිමු.

''නැහැ මේට්‍රන්, අපි මේ බලු පැටියාට බෙහෙත් දාන්න ගියා.'' බෙලින්ඩා එය පැවසුවේ විහිළුවට මෙනි.

අපි තිදෙනා හට බෙලින්ඩා කෙරෙහි ඉමහත් තරහක් ඇති විය. අපි සිතුවේ මේට්‍රන් අපි කළ වැරැද්දක් නිසා විදුහල්පතිතුමිය වෙත රැගෙන යයි කියාය.

නමුත් ඇය පැවසුවේ වෙනත් දෙයකි. ''අනේ! කොච්චර ලොකු දෙයක්ද? මම හිතන් හිටියේ හැම ළමයෙක් ම තේ පානයට ගිය පසු බලු පැටියාගේ කකුලට බෙහෙත් දැමීමට. ඔයාලා බලු පැටියාගේ තුවාලයට බෙහෙත් දැමුවාද? කෑමට මොනවාහරි දුන්නා ද?''

‘‘ඔව් මේට්‍රන් අපි බෙහෙත් නම් දැම්මා. හැබැයි කන්න නම් මොනවත් දුන්නේ නැහැ.’’

‘‘හරි ඔයාලා ඉක්මනට තේ බීලා මාව හමුවෙන්න එන්න. මගේ කාමරයට. හරි නේද?

එහෙනම් මම යනවා.’’ එසේ පවසමින් මේට්‍රන් ඉවතට ගියාය.

‘‘ මොනවද බෙලින්ඩා ඔයා ඒ කිවුවේ?’’

‘‘ මට ඒක කියවුණා. කමක් නැහැ මේට්‍රනුත් බලු පැටියා ගැන හොයන්නනේ හිතන් ඉඳලා තියෙන්නේ.’’

‘‘හ්ම්.. හරි දැන් කමක් නැහැ. මොකද මේට්‍රන් අපට මොනවත් කීවේ නැහැනේ.’’ ජෙනී කීවාය.

‘‘ අපි ඉක්මනට තේ බීලා මේට්‍රන්ගේ කාමරයට යමු.’’

‘‘හා.. හා.. අපි තේ බීලා ඉවරයිනේ. මෙතනින් බලු පැටියාට කන්න බිස්කට් ටිකකුත් ගමු.

හා... දැන් අපි යමු. අපි මේට්‍රන්ගේ කාමරයට ගොස් දොරට තට්ටු කළෙමු.’’

‘‘ඇතුළට එන්න.’’ මේට්‍රන් කීවාය.

අපි ඇතුළට ගියෙමු.

‘‘ආ.. ඔය ළමයි ආවා ද?’’ ඔයාලා බිස්කට් ගෙනාවාද බලු පැටියාට?’’

‘‘ඔව් මේට්‍රන්’’ ජෙනී කිවාය.

''හරි දැන් අපි ඉස්සෙල්ලාම විදුහල්පතිතුමිය හමු වෙන්න යමු.'' මේට්‍රන් කීවාය.

''ඇයි ඒ මේට්‍රන්?''

''මොකද බලු පැටියාට බලා ගැනීමට අවසර ලබා දුන්නොත් විතරයි අපට බලු පැටියාව බලා ගන්න වෙන්නේ. හරි අපි දැන් යමු. මේට්‍රන් කීවාය.

මේට්‍රන් විදුහල්පතිතුමියගේ කාමරයේ දොරට තට්ටු කළාය.

''එන්න.'' විදුහල්පතිතුමිය වන මිසිස් බෙලා පැවසුවාය.

අපි ඇතුළට ගියෙමු.

''මොකක්ද ප්‍රශ්නය මේට්‍රන්?''

'' මේකයි මිස් බෙලා අපේ පරණ ගොඩනැගිල්ලේ ඇතුළේ පුංචි බලු පැටියෙක් ඉන්නවා. එයාගේ කකුල තුවාල වෙලා ලේ ගලනවා. ළමයි බලු පැටියාගේ කකුලට බෙහෙත් දාමලා. ඉතින් අපිට මේ බලු පැටියාව බලා ගන්න අවසර ලබා දෙනවාද?''

''හ්ම්. හරි මම අවසර ලබා දෙන්නම්. හැබැයි දැන් වාර අවසාන නිවාඩුවත් ළඟයිනේ. ඒ නිසා කවුරුහරි මේ බලු පැටියාව රැගෙන යන්න පොරොන්දු වෙන්න ඕන. කවුද බලු පැටියාව අරන් යන්නේ''

''මම බලු පැටියාව අරගෙන යන්නම් මිස් බෙලා.'' මොරියා කීවාය.

''හොඳයි, එහෙනම් ඔයාලාට බලු පැටියාව බලා ගන්න පුළුවන්.''

''හොඳයි මිස් බෙලා, අපි එහෙනම් යන්න ද?''

'' හරි ඔයාලා යන්න. අපි පිටතට පැමිණියෙමු.''

'' දුවේ, ඔයා ඉක්මනට ගිහින් මගේ කාමරේ මේසේ උඩ තියෙන කිරි එකයි, බිස්කට් ටිකයි ගේන්න පුළුවන්ද?''

''හොඳයි මේට්‍රන්'' කියමින් ඇලීසියා දිව ගියාය.

ඉන්පසු පරණ ගොඩනැගිල්ලට ගොස් අපි බිස්කට් සමඟ කිරි බලු පැටියාට පෙවුවෙමු. දින කිහිපයක් ගත විය. බලු පැටියාගේ කකුල සුව විය.

'' හරි, දැන් අපි බලු පැටියාට නමක් දාමු. මොකක්ද අපිදානනේ?''

''අපි මෙයාට කියමු සිඩ්නි කියලා.''

'' ෂා.. ඒ නම හරි ලස්සනයි.''

වාර අවසාන දිනය උදාවිය. අපි තම තමන්ගේ බඩු අසුරා ගත්තෙමු. දැන් හැමෝම කතා කරමින් සිටියේ අපේ පුංචි සිඩ්නි ගැන.

'' මට නම් මේ වාරය තමා මගේ හොඳම වාරය.''

'' මටත් එහෙමයි. හරි අපි මේට්‍රන්ටත් කතාකරලා එමු.''

''හලෝ මේට්‍රන්, ඔයාට ගොඩක් ස්තූතියි.''

'' අනේ, ඕක මොකක්ද? මටත් හරි සතුටුයි.''

'' අන්න අපේ අම්මලා ඇවිල්ලා. අපි සිඩ්නිවත් ඇරන් යමු.''

''ආ... අලුත් යාළුවෙක් හම්බ වෙලා වගේ. කාගෙද මෙයා.''

''මගේ... මොරියා කීවාය.

'' හරි අපි දැන් යමු බෙලින්ඩා, ජෙනී, ඇලිසියා මම යනවා කියමින් මොරියා අත වැනුවාය.

''බායි මොරියා බායි සිඩ්නි'' ඔවුහු කීහ.

නිමි.



# අපූරු මිතුදම

## සඳසරා මෙත්මන්ති මහකුඹුර

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

සෙනෙවිරත්න මහලේකම්
ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

ISBN 978-624-208-774-0

10